සිංහල

# ප්‍රස්ථාව පිරුළු

5 වසර ජයමග

54 **අතු කඩා මොර කන්නා වාගේ** - කෙටි ලාභයක් සඳහා දිගුකාලීන විනාශයක් කිරීම

55 **අන්ධයෝ අලියාගේ හැඩ කිව්වා වාගේ** - අවබෝධයක් නැතිව යමක් විස්තර කිරීම

56 **කිරි ගහට ඇනීම** - හරියටම යමක් ඉටුකිරීම

57 **මරණ තුනක් ඇති මිනිහෙක් පැණි කෑවා වාගේ** - විශාල ප්‍රශ්න මැද සතුටුදායක දෙයක් සිදුවීම

58 **ඉහේ ඇම්මට කොට්ටෙ මාරුකලා වාගේ** - ඵල රහිත නොගැළපෙන විසඳුමක්

59 **හිඟන්නාගේ තුවාලය වාගේ** - බොරු අසරණකම් මවා පෑම

60 **ගහෙන් වැටුන මිනිහට ගොනා ඇන්නා වාගේ** - කරදර පිට කරදරය පැමිණීම

61 **පුහුල් හොරා කරෙන් දැනේ** - බාහිර ඉරියවු වලින් වරදකරු සොයා ගැනීම

62 **නරියා හූවෙන් හඳුනා ගත හැකිය** - කපටියා කතාවෙන් හඳුනා ගත හැකිය

63 **අහසට ඉනිමං බැන්දා වගේ** - නිෂ්ඵල කළ නොහැකි ක්‍රියාවක්

64 **කිඹුලා කිරිමැටි ගිලින්නා වාගේ** - රස ගුණ නොතකා ආහාර ගැනීම

www.facebook.com/5wasarajayamaga
5 ශිෂ්‍යත්ව විභාගය වෙනුවෙන්ම සැකසූ විෂය කරුණු එකතුව

සිංහල

# ප්‍රස්ථාව පිරුළු

32 **කබලෙන් ළිපට වැටුනා වගේ** - විපතට පත්වූ අයෙක් ඊටත් වඩා විපතකට පත් වීම

33 **අතීසාරෙට අමුඩ ගැහුවා වගේ** - නිෂ්ඵල කාර්යයක නිරත වීම

34 **දී කිරට බළලුත් සාක්කිලූ** - කවුරුත් වාසි ඇති පැත්ත ට එකතු වේ.

35 **නයාට අඳුකොළ වගෙයි** - දැකීමට කොහෙත්ම අකමැති වීම

36 **ගමරාළගේ වංඩිය වාගේ** - සෑම දෙයකටම පාවිච්චි වන භාණ්ඩයක් හැඳින්වීමට

37 **ආඬි හත් දෙනාගේ කැද හැලිය වාගේ** - අනෙකා රැවටීමට ගොස් තමාම රැවටීම.

38 **කපන්න බැරි අත ඉඹිනවා වාගේ** - පළිගැනීමට නොහැකි වූ විට ව්‍යාජ හිතවත්කම් පෑම.

39 **පනින රිලවුන්ට ඉනිමං බදින්නා වාගේ** - කාර්යයක්  කිරීමට අමතර උදව් දීම

40 **හිඟන්නාගේ පාත්තරේට හෙනහුරා වැටුනා වාගේ** - අසරණයකුටම තවත් කරදරය පැමිණීම

41 **බළලුන් ලවා කොස් ඇට බාවනවා වාගේ** - වෙන අයෙක් ලවා තම අරමුණු ඉටු කරගැනීම

42 **පරංගියා කෝට්ටේ ගියා වාගේ** - කෙටි ක්‍රම / මාවත් තිබියදී වඩා අපහසු ක්‍රමයකින් වැඩක් කිරීම හෝ ගමනක් යාම

www.facebook.com/5wasarajayamaga
5 ශිෂ්‍යත්ව විභාගය වෙනුවෙන්ම සැකසූ විෂය කරුණු එකතුව

සිංහල

# ප්‍රස්ථාව පිරුළු

5 වසර ජයමග

11. **ගඟට ඉනි කැපීම** - තේරුමක් නැති ක්‍රියාවක් කිරීම
12. **අගේ ඉඳන් කන කෑම** - ළඟින් සිට හතුරුකම් කිරීම
13. **වඳින්න ගිය දේවාලේ හිසේ කඩා වැටීම** - උදව් කරන්න ගොස් කරදරයට පත් වීම
14. **අනුන්ට කළ දේ තමන්ට පල දීම** - අනුනට කල ක්‍රියාවක ප්‍රතිඵල තමන්ට ලැබීම
15. **ඇවිලෙන ගින්නට පිදුරු දැමීම** - ප්‍රශ්නයක් කරදරයක් තවත් වැඩිකිරීම
16. **උඩ පැන්නොත් බිම වැටේ** - අධික අහංකාර කම නිසා වැනසීම
17. **රෑ වැටුන වලේ දවල් වැටීම** - දැන දැනම කරදරේ වැටීම
18. **යුද්දෙට නැති කඩුව කොස් කොටන්නද?** - අවශ්‍ය විට නැති දෙයින් පලක් නැත
19. **දේසේ හැටියට වාසේ** - තැනේ හැටියට වැඩ කිරීම
20. **ඔළුවට අත සේදීම** - නින්දා අපහාස කිරීම

සිංහල

# ප්‍රස්ථාව පිරුළු

43. **මුහුද හත් ගව්වක් තියා අමුඩ ගහනවා වාගේ** - අනවශ්‍ය සූදානම
44. **කොකා බක තපස් රැක්කා වාගේ** - කපටි අරමුණක් ඇතිව හොඳ සිල්වත් ලෙස හැසිරීම
45. **කළුවා මාරපන ගියා වගේ** - අවබෝධයක් සොයා බැලීමක් නැතිව වැඩ කිරීම
46. **ඉබ්බා දියේ දැම්මා වාගේ** - ඉතා කැමැති දෙයකට අනුබල දීම
47. **කොහොඹ ගහට කරවිල වැල ගියා වගේ** - ගැලපෙන දෙදෙනකු එකතු වීම
48. **කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ** - අසාධාරණ මෝඩ තීරණය
49. **හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ** - අනාගතය ගැන හැසිරීමෙන් පෙනේ
50. **කන කැස්බෑවා විය සිදුරෙන් අහස බලන්නා වාගේ** - ඉතා කලාතුරකින් සිදු වන
51. **ගලෙන් පට්ට ගන්නවා වාගේ** - ඉතා අමාරු දෙයක් ලබා ගැනීමට උත්සාහ කිරීම
52. **පල නොකියා පලා බෙදන්නා වාගෙ** - වචනයෙන් නොව ක්‍රියාවෙන් අකැමැත්ත පෙන්වීම
53. **දාහට අරං සීයට දුන්නා වාගේ** - ඉතා කණස්සල්ලෙන් සිටීම / අවාසියක් සිදුවීම

www.facebook.com/5wasarajayamaga

*5 ශිෂ්‍යත්ව විභාගය වෙනුවෙන්ම සැකසූ විෂය කරුණු එකතුව*

සිංහල

# ප්‍රස්ථාව පිරුළු

5 වසර ජයමග

21 **කතාව දෝලාවෙන් ගමන පයින්** - කතාවේ තරමට වැඩ නැත

22 **ගලේ කෙටුව අකුර වගේ** - ඉතා ස්ථිර / අමතක නොවන

23 **ඉබ්බාගෙන් පිහාටු ඉල්ලීම** - නොලැබෙන දෙයක් බලාපොරොත්තු වීම

24 **බීරි අලින්ට වීනා වැයීම** - නිෂ්ඵල අවවාද අනුශාසනා දීම

25 **අඬන්න ඕනලු කිරි එරෙන්න** - බලවත් සේ ඉල්ලීම් කර දෙයක් ලබා ගැනීම

26 **අටුව කඩා පුටුව හැදුවා වාගේ** - වටිනා යමක් විනාශ කර නොවටිනා දේ කිරීම

27 **අඬුව තිබියදී අත පුච්ච ගත්තා වාගේ** - වැඩක් කිරීමට පහසු ක්‍රමයක් තිබියදී අමාරුවේ වැටීම

28 **අන්දරේ සීනි කෑවා වාගේ** - ප්‍රයෝගකාරී ලෙස තම අරමුණු ඉටු කර ගැනීම

29 **අගෙන් කිරි දේව්වා වාගේ** - ඵල රහිත මෝඩ ක්‍රියාවක යෙදීම

30 **අලි මදිවට හරක්** - එක් කරදරයකට මුහුණුපාන අතර තවත් කරදරයකට පත්වීම

31 **අබරා සිල් ගත්තා වාගේ** - නුපුරුදු කටයුත්තක් කරන්නට ගොස් අමාරුවේ වැටීම

www.facebook.com/5wasarajayamaga
5 ශිෂ්‍යත්ව විභාගය වෙනුවෙන්ම සැකසූ විෂය කරුණු එකතුව